# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 3 දරන වෙළෙඳ නැව්
## (පදවි නාමය වෙනස් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 පෙබරවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2006 පෙබරවාරි මස 17 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

**2006 අංක 3 දරන වෙළෙඳ නැව්**
**(පදවි නාමය වෙනස් කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2006 පෙබරවාරි මස 13 වන දින]

එල්.ඩී.—ඕ. 35/2005.

**වෙළෙඳ නැව් අධ්‍යක්ෂ යන පදවි නාමය වෙනස් කිරීම සඳහා ද, ලිඛිත නීතියට ආනුෂංගික වන වෙනත් සංශෝධන කිරීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 2006 අංක 3 දරන වෙළෙඳ නැව් (පදවි නාමය වෙනස් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි– — 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සහ එම පනතේ වෙනත් සියළු තැන්හි දී ද වෙනත් යම් ලිඛිත නීතියක ද ; සහ

(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන, සාදනු ලබන, නියම කරනු ලබන හෝ බලය පවරනු ලබන යම් දැන්වීමක, නිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක,

"වෙළඳ නැව් අධ්‍යක්ෂ" යන වචන වෙනුවට "වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.